## ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2014

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 5 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු 61 වගන්තිය යටතේ සාදන ලද 1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝග මාලාවේ අංක 12 දරන නියෝගය සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවෙහි දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතු වුවද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 03 ට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් හේතුවෙන් ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්ත්වයට හා මූල්‍ය ප්‍රතිඵලයට වන බලපෑම සංසන්දනාත්මක තොරතුරු සමඟ නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවද, ඉකුත් වර්ෂයේදී ණයහිමියන් යටතේ දක්වා තිබුණු රු.12,573,744 ක් සමාලෝචිත වර්ෂයේදී පෙර වර්ෂයේ ලාභයට ගලපා තිබුණු නමුත් එකී ගැලපීම පිළිබඳව විස්තර මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

විදේශීය චිත්‍රපට නිෂ්පාදන අධීක්ෂණය වෙනුවෙන් වූ ආදායම් හා වියදම් පිළිවෙලින් රු.734,000 ක් හා රු. 626,000 ක් වූ අතර එම ආදායම් හා වියදම් වෙන්ව මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරනු වෙනුවට ශුද්ධ ශේෂය පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම මෙකී ශුද්ධ ශේෂයද රු.11,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එක් එක් අයිතමය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

| ගිණුමේ විස්තරය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (i) ආදායම් බදු | 999,315 | බදු නොගෙවිය යුතු බවට සාක්ෂි |
| (ii) ගෙවිය යුතු චිත්‍රපට නිෂ්පාදන ගිණුම | 1,477,210 | උපයෝගී ලියවිලි හා අනෙකුත් උපලේඛන |

(ආ) මුදල් ලබාගැනීමේදී අරමුදල විසින් " මුදල් /චෙක්පත් ගෙවීම් පෝරමයක් " සම්පූර්ණ කළද ඊට අදාල ලදුපත් විස්තර එම පෝරමයට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මුදල් ලැබීම් හා අයදුම් කිරීම් නිවැරදිව ගිණුම්ගත වන බව තහවුරු කිරීමට විගණනයේදී නොහැකි විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයේ චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂය රු. 64,682,582 ක් වී තිබුණු අතර එම ශේෂයෙන් සියයට 100 ක් හෙවත් සම්පූර්ණ ශේෂයම වසර පහකට වැඩි කාලයක සිට අයවිය යුතුව තිබුණි. චිත්‍රපට නිෂ්පාදනය සඳහා ලබාදී තිබූ ණය මුදල් වෙනුවෙන් වූ කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලැබී නොතිබූ අතර, චිත්‍රපට නිෂ්පාදන ණය ශේෂය සම්පූර්ණයෙන්ම අය කරගත නොහැකි බවට ඇස්තමේන්තු කර තිබුණි.

(ආ) අරමුදල පවත්වාගෙන යාම සඳහා දේශීය හා විදේශීය චිත්‍රපටවලින් චිත්‍රපට සංස්ථාවට අයවිය යුතු සංස්ථා භාරයෙන් සියයට 20 ක් අරමුදලට ලබාදිය යුතු නමුත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අරමුදලට ලැබිය යුතුව පැවැති චිත්‍රපට කුළී දායකත්වය රු. 21,913,443 ක් වී තිබුණි.

(ඇ) අළුත්වැඩියාව හා නවීකරණය සඳහා සිනමාශාලා 03 ක් වෙත ලබා දී තිබුණු ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය රු. 10,216,174 ක් විය. එම ණය මුදලින් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලැබුණේ රු. 566,664 ක් හෙවත් සියයට 04 ක් පමණි. සිනමාශාලා 02 කින් කිසිදු ණය වාරිකයක් අයවී නොතිබුණි.

(ඈ) අරමුදල විසින් නිෂ්පාදනය කර චිත්‍රපට සංස්ථාවට විකුණනු ලැබූ චිත්‍රපටයකින් 2005 වර්ෂයේ සිට අයවිය යුතුව පැවති රු. 3,547,454 ක මුදලක් චිත්‍රපට සංස්ථාවෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාළව චිත්‍රපට සංස්ථාවෙන් ලැබිය යුතු රු. 1,406,512 ක චිත්‍රපට කුළී දායකත්වයට අදාල කිසිදු මුදලක් අරමුදල වෙත ලැබී නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1996 ඔක්තෝබර් 24 දිනැති අංක 946/9 දරන චිත්‍රපට සංවර්ධන අරමුදල සම්බන්ධ ගැසට් පත්‍රය නියෝග අංක 6 (ඇ) | ප්‍රදානය කළ ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාරයන් නිශ්චය කර අයකර ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2000 ජුනි 12 දිනැති අංක පීඑෆ් / පීපී / 09 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2000 වර්ෂයේදී ආයෝජනය කර තිබුණු වටිනාකම රු. 2,000,000 ක් හා සමාලෝචිත වර්ෂයේදී ආයෝජනය කර තිබුණු රු.2,859,229 ක් වු ස්ථාවර තැන්පතු සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 679,301 ක බදු පෙර ඌනතාවයක් වූ අතර එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර අතිරික්තය රු. 4,635,230 ක් විය. මේ අනුව ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 5,314,531 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී රු. 5,912,983 ක බොල් ණය වෙන් කිරීමක් සිදු කර තිබීම පිරිහීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1994 අංක 1 දරන ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ නියෝග මාලාවේ අංක 4 දරන නියෝගය යටතේ දක්වා තිබුණු සංවර්ධන අරමුදලේ කාර්යයන් කිසිවක් සමාලෝචිත වර්ෂය තුළදී ඉටුකර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 වර්ෂයේදී සිනමාශාලාවක් සඳහා ලබා දී තිබුණු ණය හා ඒ සඳහා පොළී මුදල වන රු.2,355,959 න් කිසිදු ණය වාරිකයක් හෝ පොළී මුදලක් ආපසු අය කර ගැනීමට අරමුදල කිසිදු නීතිමය පියවරක් නොගෙන මුළු වටිනාකම අය කර ගත නොහැකි ලෙස ඇස්තමේන්තු කර ණයගැති ශේෂයෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එකී ණය මුදල අදාල කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) ජාතික චිත්‍රපට සංස්ථාව 2007 වර්ෂයේදී ඉන්දියාවේ පෞද්ගලික රසායනාගාරයක් සමඟ එක්වී චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීමට සැලසුම්කර, ඒ සඳහා මූලික වියදම් ලෙස රු. 200,000 ක් වැය කර තිබුණද නිෂ්පාදකයකු සොයා ගැනීමට නොහැකි වීම හේතුවෙන් නිෂ්පාදනය අතහැර දමා එම මුදල අරමුදලේ චිත්‍රපට තොගයට ඇතුළත් කර තිබුණි.

(ඇ) තිර රචනා ඇගයීම් කමිටුව හා පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද චිත්‍රපටයක් නිෂ්පාදනය සඳහා 2001 වර්ෂයේදී සංස්ථාව විසින් රු. 3,737,222 ක ණය මුදලක් ලබාදී තිබු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවිය යුතු සම්පූර්ණ මුදල රු.6,253,983 ක් විය. එම චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීමට ඉදිරිපත් නොකර සමාලෝචිත වර්ෂයේදී අයකරගත නොහැකි ණය ලෙස සලකා ලාභයට ගැලපීම් කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂයද ඇතුළත් වන පරිදි සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයා වෙත වරින්වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ණය අයකර ගැනීම

(ආ) අධිභාර